
# මාසික වෙළඳ විවරණිකාව

## ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව
## ශ්‍රී ලංකා මහ බැංකුව


**2022 ජූනි**
**04 වෙළුම 06 නිකුතුව**

## විශේෂ සිදුවීම්

### මාසික අපනයන ක්‍රියාකාරිත්වය





### මාසික ආනයන ක්‍රියාකාරිත්වය





2022 වසරේ ජූනි මාසය තුළ දී වෙළඳ භාණ්ඩ අපනයන ආදායම එ.ජ.ඩොලර් මිලියන 1,248ක් දක්වා පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 23.9කින් ඉහළ ගියේය.

2022 වසරේ ජූනි මාසය තුළ දී වෙළඳ භාණ්ඩ ආනයන වියදම එ.ජ.ඩොලර් මිලියන 1,226ක් දක්වා පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 26.1කින් පහළ ගියේය.

### අපනයන හා ආනයන වර්ධන අනුපාත (%)




### වෙළඳ ශේෂය (එ.ජ. ඩොලර් මිලියන)





2022 වසරේ පළමු භාගය තුළ දී අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 14.3කින් ඉහළ ගිය අතර, ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 0.1කින් සුළු වශයෙන් ඉහළ ගියේය.


2022 වසරේ ජූනි මාසය තුළ දී වෙළඳ ගිණුමේ ශේෂය, 2021 වසරේ ජූනි මාසයේ පැවති එ.ජ.ඩොලර් මිලියන 652ක හිඟයට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 21 ක අතිරික්තයක් වාර්තා කළේය.

## ප්‍රධාන අපනයන හා ආනයන කාණ්ඩ - (2022 ජන.- ජූනි)


### අපනයන (එ.ජ. ඩොලර් මිලියන)





### ආනයන (එ.ජ. ඩොලර් මිලියන)



# අපනයන ක්‍රියාකාරිත්වය










2022 වසරේ පළමු භාගය තුළ දී, ප්‍රධාන වශයෙන් කාර්මික අපනයන ඉහළ යෑම හේතුවෙන් අපනයන ආදායම ඉහළ ගියේය. එසේ වුවත්, කෘෂිකාර්මික සහ ඛනිජමය අපනයන පහළ යෑමක් වාර්තා කළේය.


2022 වසරේ පළමු භාගය තුළ දී, අපනයන පරිමා දර්ශකය සහ අපනයන මිල දර්ශකය, පිළිවෙළින්, සියයට 11.9කින් සහ සියයට 2.2කින් ඉහළ ගියේය.

## කෘෂිකාර්මික අපනයන

















2022 වසරේ පළමු භාගය තුළ දී, තේ, කුළුබඩු සහ සකස් නොකළ දුම්කොළ අපනයන ආදායම පහළ යෑමත් සමඟ කෘෂිකාර්මික අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව පහළ ගියේය. කෙසේ වුවත්, මෙම කාලපරිච්ඡේදය තුළ දී, මුහුදු ආහාර, සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත. පොල් සහ රබර් ඉහළ අපනයන ආදායම් වාර්තා කළේය.

# කාර්මික අපනයන












2022 වසරේ පළමු භාගය තුළ දී කාර්මික අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව ඉහළ ගිය අතර, මේ සඳහා ප්‍රධාන වශයෙන්, රෙදිපිළි හා ඇඟලුම්, ඛනිජතෙල් නිෂ්පාදිත, මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ, සහ යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ අපනයන ආදායම ඉහළ යෑම හේතු විය. කෙසේ වුවත්, මෙම කාලපරිච්ඡේදය තුළ දී රබර් නිෂ්පාදිත සහ ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත අපනයන ආදායම පහළ ගියේය.

# ආනයන ක්‍රියාකාරිත්වය






ප්‍රධාන වශයෙන්, අන්තර් භාණ්ඩ ආනයන වියදම ඉහළ යෑම හේතුවෙන්, 2022 වසරේ පළමු භාගය තුළ දී, වෙළඳ භාණ්ඩ ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සුළු වශයෙන් ඉහළ ගියේය. මේ අතර, මෙම කාලපරිච්ඡේදය තුළ දී, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව ආනයන පරිමා දර්ශකය සියයට 14.9කින් පහළ ගිය අතර, ආනයන මිල දර්ශකය සියයට 17.6කින් ඉහළ ගියේය.

# පාරිභෝගික භාණ්ඩ ආනයන


පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම





පාරිභෝගික භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක




පාරිභෝගික භාණ්ඩ ආනයනවල ක්‍රියාකාරිත්වය (ජන. - ජූනි)





සීනි, පරිප්පු සහ කිරිපිටි සඳහා වූ ආනයන මිල ගණන් වල සාමාන්‍ය





ප්‍රධාන වශයෙන්, විදුලි සංදේශ මෙවලම්, ගෘහ උපකරණ සහ බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත ඇතුළු ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම පහළ යෑම හේතුවෙන්, 2022 වසරේ පළමු භාගය තුළ දී, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම සැලකිය යුතු ලෙස පහළ ගියේය. තවද, ආහාර හා පාන වර්ග කාණ්ඩය යටතේ වර්ග කරන සීනි හා රසකැවිලි, තෙල් හා මේද වර්ග සහ එළවළු ආනයන වියදමෙහි පහළ යෑම් දක්නට ලැබුණි. කෙසේ වුවත්, මෙම කාලපරිච්ඡේදය තුළ දී, ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත, රෙදිපිළි හා උපාංග සහ පාන වර්ග සඳහා වන ආනයන වියදම් ඉහළ අගයක පැවතිණි.

# අන්තර් භාණ්ඩ ආනයන


අන්තර් භාණ්ඩ ආනයන වියදම





අන්තර් භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක



**අන්තර් භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය (ජන.- ජූනි)**




**බොර තෙල් හා පොහොර ආනයන මිල ගණන් (මාසික සාමාන්‍ය අගයන්)**




*2021 වසරේ මාර්තු, ජූනි,සැප්තැම්බර්, නොවැම්බර් මාසවල සහ 2022 වසරේ මාර්තු, අප්‍රේල් සහ ජූනි මාසවල බොරතෙල් ආනයනය කර නැත.


ප්‍රධාන වශයෙන්, ඉන්ධන, රෙදිපිළි හා රෙදිපිළි උපාංග, දියමන්ති, අගනා ගල් හා ලෝහ වර්ග සහ කඩදාසි, ඝන කඩදාසි හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත ආනයන වියදම ඉහළ යෑම හේතුවෙන්, 2022 වසරේ පළමු භාගය තුළ දී අන්තර් භාණ්ඩ ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව ඉහළ ගියේය. කෙසේ වුවත්, 2022 වසරේ අදාළ කාලපරිච්ඡේදය තුළ මූල ලෝහ, රසායනික නිෂ්පාදිත, පොහොර සහ තිරිඟු ආනයන වියදම පහළ ගියේය.

## ආයෝජන භාණ්ඩ ආනයන


**ආයෝජන භාණ්ඩ ආනයන වියදම**




**ආයෝජන භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක**




**ආයෝජන භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය (ජන.- ජූනි)**




යන්ත්‍රසූත්‍ර හා උපකරණ, ප්‍රවාහන උපකරණ සහ ගොඩනැගිලි ද්‍රව්‍ය ඇතුළු ප්‍රධාන ආයෝජන භාණ්ඩ කාණ්ඩ තුනෙහිම ආනයන වියදම පහළ යෑම හේතුවෙන්, 2022 වසරේ පළමු භාගය තුළ දී ආයෝජන භාණ්ඩ ආනයන වියදම පහළ ගියේය.

# විදේශීය වෙළඳාම - සාරාංශය (අ)

## අපනයන ක්‍රියාකාරිත්වය (එ.ජ. ඩොලර් මිලියන)

| | | ජූනි- 2021 | ජූනි- 2022 | වෙනස (%) | ජන. - ජූනි 2021 | ජන.- ජූනි 2022 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **කෘෂිකාර්මික අපනයන** | | **230.3** | **251.5** | **9.2** | **1,258.9** | **1,226.0** | **-2.6** |
| එයින් | තේ | 123.9 | 116.5 | -6.0 | 650.5 | 577.4 | -11.2 |
| | පොල් | 38.6 | 40.5 | 5.1 | 196.2 | 215.8 | 10.0 |
| | කුළුබඩු | 35.5 | 31.7 | -10.6 | 196.8 | 159.6 | -18.9 |
| | මුහුදු ආහාර | 15.8 | 36.4 | 130.8 | 106.4 | 142.2 | 33.6 |
| **කාර්මික අපනයන** | | **771.4** | **990.3** | **28.4** | **4,407.7** | **5,260.3** | **19.3** |
| එයින් | රෙදිපිළි හා ඇඟලුම් | 415.5 | 568.8 | 36.9 | 2,487.4 | 2,977.3 | 19.7 |
| | රබර් නිෂ්පාදිත | 92.9 | 99.5 | 7.2 | 499.7 | 493.3 | -1.3 |
| | ඛනිජතෙල් නිෂ්පාදිත | 41.3 | 54.2 | 31.3 | 196.7 | 345.3 | 75.6 |
| | ආහාර, පාන වර්ග හා දුම්කොළ | 41.7 | 52.3 | 25.4 | 248.0 | 274.4 | 10.6 |
| | යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 45.2 | 50.0 | 10.5 | 242.1 | 270.5 | 11.7 |
| | මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 21.2 | 35.1 | 65.7 | 132.2 | 192.3 | 45.5 |
| | සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 4.7 | 6.8 | 46.2 | 22.5 | 37.3 | 65.5 |
| **ඛනිජ හා වෙනත් අපනයන** | | **5.4** | **6.0** | **12.1** | **32.4** | **27.9** | **-13.8** |
| **මුළු අපනයන** | | **1,007.0** | **1,247.8** | **23.9** | **5,699.1** | **6,514.2** | **14.3** |

## ආනයන ක්‍රියාකාරිත්වය (එ.ජ. ඩොලර් මිලියන)

| කාණ්ඩය | | ජූනි- 2021 | ජූනි- 2022 | වෙනස (%) | ජන. - ජූනි 2021 | ජන.- ජූනි 2022 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **පාරිභෝගික භාණ්ඩ** | | **382.2** | **176.5** | **-53.8** | **1,912.3** | **1,530.2** | **-20.0** |
| **ආහාර හා පාන වර්ග** | | 165.0 | 89.0 | -46.1 | 914.9 | 856.9 | -6.3 |
| එයින් | එළවළු (ආ) | 39.6 | 21.6 | -45.5 | 211.1 | 169.1 | -19.9 |
| | සහල් | 1.5 | 16.2 | 969.7 | 7.0 | 170.8 | 2,347.1 |
| **වෙනත් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ** | | 217.2 | 87.5 | -59.7 | 997.4 | 673.3 | -32.5 |
| එයින් | පෞද්ගලික රථවාහන | 0.4 | 0.5 | 35.5 | 4.4 | 3.9 | -11.3 |
| **අන්තර් භාණ්ඩ** | | **839.0** | **815.7** | **-2.8** | **5,950.1** | **6,658.4** | **11.9** |
| එයින් | ඉන්ධන | 66.3 | 200.1 | 201.9 | 1,787.2 | 2,583.9 | 44.6 |
| | රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 276.8 | 280.9 | 1.5 | 1,451.1 | 1,685.6 | 16.2 |
| | පොහොර | 2.2 | 1.5 | -30.6 | 97.5 | 46.0 | -52.8 |
| | තිරිඟු හා ඉරිඟු | 43.6 | 12.2 | -72.0 | 184.6 | 136.3 | -26.2 |
| **ආයෝජන භාණ්ඩ හා වෙනත්** | | **438.0** | **234.3** | **-46.5** | **2,152.3** | **1,839.6** | **-14.5** |
| එයින් | යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 270.3 | 156.4 | -42.2 | 1,366.5 | 1,181.3 | -13.6 |
| **මුළු ආනයන** | | **1,659.2** | **1,226.5** | **-26.1** | **10,014.7** | **10,028.1** | **0.1** |

## වෙළඳ ශේෂය (එ.ජ. ඩොලර් මිලියන)

| කාණ්ඩය | ජූනි- 2021 | ජූනි- 2022 | වෙනස (%) | ජන. - ජූනි 2021 | ජන.- ජූනි 2022 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **වෙළඳ ශේෂය** | -652.2 | 21.3 | | -4,315.7 | -3,513.9 | |

## වෙළඳ දර්ශක හා වෙළඳ මිල අනුපාතය (2010 = 100) (ඇ)

| කාණ්ඩය | | ජූනි- 2021 | ජූනි- 2022 | වෙනස (%) | ජන. - ජූනි 2021 | ජන.- ජූනි 2022 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **අපනයන** | | | | | | | |
| | වටිනාකම් දර්ශකය | 140.2 | 173.7 | 23.9 | 132.2 | 151.1 | 14.3 |
| | පරිමා දර්ශකය | 157.0 | 193.9 | 23.5 | 148.8 | 166.5 | 11.9 |
| | මිල දර්ශකය | 89.3 | 89.6 | 0.3 | 88.8 | 90.7 | 2.2 |
| **ආනයන** | | | | | | | |
| | වටිනාකම් දර්ශකය | 148.5 | 109.8 | -26.1 | 149.4 | 149.6 | 0.1 |
| | පරිමා දර්ශකය | 146.7 | 102.2 | -30.3 | 164.0 | 139.6 | -14.9 |
| | මිල දර්ශකය | 101.2 | 107.4 | 6.1 | 91.1 | 107.1 | 17.6 |
| **වෙළඳ මිල අනුපාතය** | | 88.2 | 83.4 | -5.4 | 97.5 | 84.7 | -13.1 |

(අ) තාවකාලික
(ආ) පරිප්පු, ළූණු, අර්තාපල්, රනිල කුලයට අයත් එළවළු සහ වෙනත් එළවළු ඇතුළත් වේ.
(ඇ) එ.ජ. ඩොලර්වලින් ගණනය කරන ලද